

මහර - කඩවත Sterling Aftercare මධ්‍යස්ථානය

# පාරිභෝගික සේවයේ විශිෂ්ටත්වය තුළින් මෝටර් රථ සේවා සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා STERLING AFTERCARE CENTRE

**ශ්‍රී ලංකාවේ මෝටර් රථ සේවා සැපයුම් ක්ෂේත්‍රය හා බැඳි කීර්තිමත් නාමයක් වන ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම නිරතුරුව තම පාරිභෝගිකයන්ට උපරිම සහ ගුණාත්මක සේවයක් සලසන ආයතනයකි. Sterling පාරිභෝගික සේවා විශිෂ්ටත්වය පිළිබඳව Sterling Aftercare Centreහි පාරිභෝගික සේවා කළමනාකාරිනී දීපා මුණසිංහ මහත්මිය සමඟ කළ සාකච්ඡාවක් පහතින් දිග හැරේ.**

**ඕනෑම ආයතනයකට හෝ සමාගමකට ගුණාත්මක පාරිභෝගික සේවයක් සැපයීම වැදගත් වන්නේ ඇයි?**

ආයතනයක හෝ සමාගමක වේවා ඕනෑම ව්‍යාපාරික කටයුත්තක උන්නතිය එහෙමත් නැත්නම් දියුණුව රඳා පවතින්නේ ඒ ඒ පාරිභෝගිකයන් මතයි. කිසියම් ආයතනයක් සඳහා අලුතින් පාරිභෝගිකයෙක් එක්කර ගැනීමේදී ආයතනය, දැනට සිටින පාරිභෝගිකයෙක් සඳහා දරන වියදම මෙන් පස් ගුණයක වියදමක් දැරිය යුතු වනවා. තෘප්තිමත්/සතුටුදායක පාරිභෝගිකයන් සහ අතෘප්තිමත්/අසතුටුදායක පාරිභෝගිකයන් සසඳා බලනවිට අතෘප්තිමත් පාරිභෝගිකයන්ට සාපේක්ෂව තෘප්තිමත් පාරිභෝගිකයන් ආයතනයකට තුන් ගුණයක් ලාභ ගෙන දෙනවා. ඕනෑම පාරිභෝගිකයෙක් කිසියම් ආයතනයකට හෝ ව්‍යාපාරික ස්ථානයකට පිවිස අදාළ සේවාව හෝ භාණ්ඩය ලබා ගන්නා කාලසීමාව (Customer Lifetime Value) පුරාවට පාරිභෝගිකයන්හට ගුණාත්මක සේවාවක් ලබාදීම ඕනෑම ව්‍යාපාරයක් සතු වගකීමක් වනවා.

අපගේ පාරිභෝගිකයන් දිගු කාලයක් තිස්සේ අපගෙන් සේවා ලබා ගන්නා පිරිසක්. Sterling Aftercare Guarantee වගකීම් සහතිකය යටතේ මෝටර් රථ මිල දී ගත් සේවාදායකයින්ට වගකීම් කාලසීමාව තුළදී අදාළ වාහනයේ අවශ්‍යතා සපුරාලීමටත් සේවා සැපයීමටත් අප ආයතනය බැඳී සිටිනවා. එලෙස පාරිභෝගිකයන් පැහැදිලිව හඳුනාගෙන ඔවුන් හට ගුණාත්මක සේවාවක් ලබා දී ඔවුන් අප සමඟ රඳවා ගැනීම, අපගේ දිගුකාලීන ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙන්ම මතු ආයෝජන සඳහා වටිනාකමක් ලබා දීමටද ඉවහල් වන බව අප විශ්වාස කරනවා.

මෝටර් රථ හා සම්බන්ධිත සේවා සපයන අනෙකුත් ආයතන සමඟ තරගකාරී ලෙස රැඳී සිටීමටත් අපගේ ගුණාත්මක සේවය බලපානවා. අප වෙත සේවා ලබා ගැනීමට පැමිණෙන පාරිභෝගිකයන් තෘප්තිමත් ලෙස පිටත්කර හැරීමට අප කණ්ඩායම සැමවිටම ක්‍රියා කරන්නේ මේ නිසයි.

**මෝටර් රථ හා සම්බන්ධිත සේවා සපයන පුළුල් ව්‍යාපාරික ආයතන අතරේ Sterling Aftercare Centreහි පාරිභෝගික සේවාව විශේෂ වන්නේ කුමන හේතු නිසා ද?**

ලංකාවේ පිහිටුවා තිබෙන Sterling Aftercare මධ්‍යස්ථානයන්හි ප්‍රධාන කාර්යභාරය වන්නේ අපගේ මවු සමාගම වන Sterling Japan විසින් ශ්‍රී ලංකාවට ආනයනිත මෝටර් රථ සඳහා Sterling Aftercare Guarantee වගකීම් සහතිකය යටතේ අලෙවියෙන් පසු සේවා ලබා දීමයි. මෙම වගකීම් සහතිකය යටතේ මිලදී ගත් රථවාහන වලට වසර 02ක හෝ 03ක වගකීම් කාල සීමාවකට අදාළව සඳහා සේවා ලබා ගැනීමටයි අප වෙත පාරිභෝගිකයන් පැමිණෙන්නේ. අදාළ වගකීම් කාල සීමාව තුළ අප ඒ පාරිභෝගිකයන් සමඟ ඍජුව ගනුදෙනු කරනවා. මොනයම් හෝ හේතුවක් නිසාවෙන් ඔවුන් හා අප ආයතනය අතර පවතින සබඳතාව බිඳී ගියහොත් එය ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා සමාගමේ මෙන්ම අපගේ මවු සමාගමේ වෙළඳ නාමයටත් බලපාන කරුණක් වනවා.

වාහන නිෂ්පාදනය කර බෙදාහරින සමහර ආයතන අදාළ මෝටර් රථ සඳහා නිෂ්පාදකයාගේ වගකීම් සහතිකය (Manufacturer Warranty) නිකුත් කරනවා. නමුත් නිෂ්පාදකයාගේ වගකීම් සහතිකය ඔස්සේ ආවරණය නොවන උපාංග සඳහාත් අප වගකියනු ලබනවා. ඊට හොඳම උදාහරණය වන්නේ Nissan X-Trail මාදිලියේ රථවල පැවති ගියර් පද්ධති (Gear box) දෝෂය. එවැනි මෝටර් රථ සඳහා එම දෝෂය නිසිආකාරව නිවැරදි කිරීමට අවශ්‍ය උපාංග වගකීම් සහතිකය යටතේ, පාරිභෝගිකයන්හට අප ආයතනය විසින් ලබා දෙනු ලැබුවේ කිසිඳු අය කිරීමක් සිදු නොකරමින්ය. මෙහිදී එක් ගනුදෙනුකාර භවතෙක් සඳහා රුපියල් ලක්ෂ 15-20ත් අතර මුදලක් අප වෙන් කරනු ලැබුවා.

එසේම Sterling Aftercare Guarantee වගකීම් සහතිකය යටතේ මිලදී ගත් සහ Sterling Aftercare Centre වෙතින් නඩත්තුව සිදු කරන රථවාහන ඉතා උසස් සේවා ප්‍රමිතීන් යටතේ නඩත්තු වන නිසා එම මෝටර් රථ නැවත විකිණීමේදී, පාවිච්චි කරන ලද රථ සඳහා පවතින වෙළෙඳපොල තුළ වැඩි වටිනාකමක් එකතු කර ගැනීමට සමත් වනවා.



නාරාහේන්පිට Sterling Aftercare මධ්‍යස්ථානය



ගාල්ල Sterling Aftercare මධ්‍යස්ථානය



නුගේගොඩ - උඩහමුල්ල Sterling Aftercare මධ්‍යස්ථානය



දූනගහ - මිනුවන්ගොඩ Sterling Aftercare මධ්‍යස්ථානය

**සේවා හෝ අලුත්වැඩියා කටයුත්තක් සඳහා Sterling Aftercare Centre වෙත වාහනය ගෙන ඒමට බලාපොරොත්තුවන පාරිභෝගිකයන්ට ඔබ ආයතනය පහසුකම් සලසා තිබෙන්නේ කෙසේද?**

Sterling Aftercare Centre අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයන්ගේ මෝටර් රථ සඳහා අවශ්‍ය සේවාවන් අදාළ නිර්නායකයන්ට අනුකූලව ගුණාත්මක අයුරින් පිරිනැමීමයි. Sterling Aftercare Centre හිදී ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවාව ලබා දීමට කටයුතු කරනවා. Sterling Aftercare වගකීම් සහතිකය ලැබූ හෝ නොලැබූ ඕනෑම මෝටර් රථයක් සඳහා නඩත්තු සේවා, කාර්මික සේවා සහ නියම ජපන් අමතර කොටස් සහ උපාංග Sterling Aftercare Center තුළින් ලබා ගත හැකිය. එමෙන්ම රථවාහන අනතුරු නිසා හානි සිදු වූ මෝටර් රථ නැවත යථා තත්ත්වයට පත්කිරීමට උපකාරී වන Car-O-Liner 'Mark 6' වැනි නවීන තාක්ෂණික උපකරණ අප ආයතනය සතුයි. මේ ඕනෑම සේවාවක් ලබා ගැනීමට බලාපොරොත්තු වන රථවාහන හිමිකරුවෙකු වන ඔබ පළමුවෙන්ම සිදු කළ යුත්තේ 0117 600 800 අංකය ඔස්සේ පාරිභෝගික සේවා අංශය අමතා ඔබේ රථය අප පද්ධතියේ ලියාපදිංචි කිරීමයි. සතියේ දින සහ සෙනසුරාදා දිනවල උදෑසන 8 සිට සවස 5 දක්වා අපගේ ක්ෂණික දුරකතන අංකය ඇමතිය හැකියි.

හදිසියේ වාහනයේ ක්‍රියාකාරීත්වය අඩපණ වූ විටකදී පැය 24 පුරා ක්‍රියාත්මක Roadside Assistance Service ඇමතීමෙන් ඔබට අවශ්‍ය උපදෙස් හෝ සේවා ලබා ගත හැකියි.

**Sterling Aftercare ඕනෑම මධ්‍යස්ථානයකට පිවිසෙන පාරිභෝගිකයින්ගේ සුවපහසුව සඳහා සලසන සේවාවන් පිළිබඳව සඳහන් කරනවා නම්...**

අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් (Service Advisers) ඔස්සේ වාහනයට නිර්දේශිත අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි. ඒ වගේම Sterling Aftercare මධ්‍යස්ථාන තුළ වාහන හිමිකරුට වාහනය සම්බන්ධව සිදු කරන සේවා හෝ අලුත්වැඩියා සම්බන්ධ කටයුතු නිරීක්ෂණය කිරීමට බාධාවක් නොමැති අතර ඊට අවශ්‍ය පහසුකම්ද මෙහි ස්ථාපිත කර තිබෙනවා. වාහන හිමිකරුට අවශ්‍ය පරිදි වැඩබිම වෙත පිවිස එහි ක්‍රියා පටිපාටිය නිරීක්ෂණය කළ හැකිවීම අප සතු විනිවිදභාවයෙන් යුතු සේවාව පිළිබඳ සාක්ෂි දරනවා.

සාමාන්‍යයෙන් මෝටර් රථයක පූර්ණ සේවා (Full Service) කටයුත්තක් සඳහා පැය 4-5 ක කාලයක් සේවා මධ්‍යස්ථානය තුළ ගෙවා දැමීමට පාරිභෝගිකයාට සිදුවෙනවා. එහිදී පාරිභෝගිකයාට අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත විවේක ශාලාවක් (Customer Lobby) අපගේ සෑම සේවා මධ්‍යස්ථානයකම ඉදිකර තිබෙනවා.

මේ සියලුම Sterling Aftercare මධ්‍යස්ථානයක් ඔස්සේම පරිසර හිතකාමී බවින් යුත් ගුණාත්මක සේවයක් පාරිභෝගික ඔබට සැලසීමට අප පියවර ගන්නවා. අපගේ සියලුම ශාඛාවලට මෙහෙයුම් සඳහා පිරිනමන ISO-9001 නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ISO-14001 පරිසර තත්ත්ව සහතිකය ලැබී තිබෙනවා. විශේෂයෙන්ම ISO-14001 පරිසර තත්ත්ව සහතිකය ලබා ඇති වාහන ආශ්‍රිත සේවා සපයන ශ්‍රී ලාංකික ආයතන කිහිපය අතර Sterling Aftercare අපත් සිටිනවා.

**හෂිනි ඉරේෂා ගුණවර්ධන**















නාරාහේන්පිට | උඩහමුල්ල - නුගේගොඩ | මහර - කඩවත | දූනගහ - මිනුවන්ගොඩ | ගාල්ල

+94 117 600 800 www.sterling.lk